2024.10.24 - අරුණ පිටුව 1, 2

# 1981ට සාපේක්ෂව මෙරට ගොඩනැගිලි දෙගුණයකින් වැඩිවෙලා

## ජන සංගණනයේදී හෙළිවෙයි

■ සාලිය කුමාර ගුණසේකර

ජන හා නිවාස සංගණනයට අදළව කරන ලද ලැයිස්තුගත කිරීමේ අදියරේදී මෙරට තුළ දිවයිනේ සියලුම

»02 පිටුවට

## 1981ට සාපේක්ෂව....

ග්‍රාම නිලධාරී කොට්ඨාසවල සංගණන ඒකක (නිවාස, සමූහ වාසස්ථාන, නේවාසික ආයතන හා වාසය සඳහා නොවන ස්ථාන) 8,377,895 පවතින බව අනාවරණය වී ඇති අතර එය 1981 වසරේ කරන ලද සංගණනයේ මෙන් දෙගුණයකට වඩා වැඩිවීමක් බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

ඒ අනුව, මෙම සංගණයේදී මෙරට තුළ නිවාස ඒකක පමණක් 6,762,644 ක් පවතින බව ලැයිස්තු ගත කර තිබෙන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන අධිකාරි/ අධ්‍යක්ෂ ජනරාල් ඩී.ඩී ජී.ඒ. සෙනෙවිරත්න පැවැසුවාය. නිවාස ඇතුළු වැඩිම සංගණන ඒකක ප්‍රමාණයක් වාර්තා වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙනි. එම දිස්ත්‍රික්කයෙන් සංගණන ඒකක 939,135 ක් වාර්තා වන අතර, එය සමස්ත සංගණන ඒකක ප්‍රමාණයෙන් සියයට 11.2 කි. එම දිස්ත්‍රික්කයේ නිවාස ඒකක පමණක් 770,132 කි. දිවයිනේ සමස්ත නිවාස ඒකක ගණනට අනුව එය ප්‍රතිශතයක් ලෙස සියයට 11.4 කි. අඩුම ප්‍රමාණයක් සටහන් වන්නේ මන්නාරම දිස්ත්‍රික්කයෙනි.

මෙවර සංගණනයට අනුව (2024) සමූහ වාසස්ථාන 46,376 ක්ද, නේවාසික ආයතන 57,186 ක්ද, වාසය සඳහා නොවන ස්ථාන 1,511,689 ක්ද තිබෙන බව ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියයි. 1981 සංගණනයේදී වාර්තා වී තිබූ නිවාස ඇතුළු සංගණන ඒකක ප්‍රමාණය 3,423,486 කි.

මෙරට සංගණන ඉතිහාසයේ පළමු වරට පරිගණක තාක්ෂණය උපයෝගී කරගනිමින් සංගණන කටයුතු සිදු කෙරෙන බවද අධ්‍යක්ෂ ජනරාල්වරිය කියා සිටියාය.